# පුනරීක්ෂණ අභ්‍යාස

1. කලා මූලිකාංග නම් කරන්න.

2. නිර්මාණයක් ගොඩ නැගීමේදී නිර්මාණයෙහි ස්වභාවය අනුව යොදා ගන්නා රේඛාවලින් දනවන හැඟීම් මොනවාද?

3. වක්‍ර රේඛාවලින් දැනවෙන හැඟීම් 03 ලියන්න

4. සිහින් සිරුරැති දියණියක සඳහා සායක් මැසීමේදී සුදුසු රෙදි වර්ගයකට ගැලපෙන රේඛා නම් කරන්න.

5. දිග පළල හා උස දක්වන රේඛා තුළින් පෙන්නුම් කරන හැඩය ලියන්න.

6. ප්‍රාථමික වර්ණ නම් කරන්න.

7. ද්විතියික වර්ණ සාදා ගන්නා ආකාරය උදාහරණ සහිතව දක්වන්න.

8. ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබදව ඇති ද්විතියික වර්ණයක් සම ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමෙන් සැදෙන වර්ණය නම් කරන්න.

9. තෘතියික වර්ණ සාදා ගන්නා ආකාරය ලියා දක්වන්න.

10. වර්ණ චක්‍රය ගොඩ නගා ඇත්තේ කුමන වර්ණ ආශ්‍රයෙන්ද?

11. උදාසීන වර්ණවලට උදාහරණ 03ක් ලියන්න.

12. උණුසුම් වර්ණ ලෙස හැඳින්වෙන්නේ වර්ණ චක්‍රයේ කුමන වර්ණයේ සිට කුමන වර්ණය දක්වාද?

13. වර්ණ චක්‍රයේ සිසිල් වර්ණ ලෙස හැඳින්වෙන්නේ කුමන වර්ණයේ සිට කුමන වර්ණය දක්වාද?

14. වර්ණවල ගුණාංග 02 ලියන්න.

15. වර්ණ අගමානය භාවිතා වන්නේ වර්ණයක කුමක් දැනගැනීම සඳහාද?

16. වර්ණයක තීව්‍රතාවය යන්න හඳුන්වන්න.

17. වර්ණයක දීප්තිමත් බව අඩු කිරීමට කළ යුත්තේ කුමක්ද?

18. ප්‍රධාන මෝස්තර මූලධර්ම නම් කරන්න.

19. ඒක වර්ණ ගැලපුම කෙටියෙන් පහදන්න.

20. රිද්මය සඳහා උදාහරණ දක්වන්න.

21. ගෙවත්තක පාංශු ඛාදනය වළක්වා ගැනීමට කළ හැකි ක්‍රියාකාරකම් 03ක් දක්වන්න.

22. නිවසක දර්ශනීය ගෙවත්තක් සැකසීමට කළ හැකි අලංකාර ක්‍රම 04ක් ලියන්න.

23. ආහාර ජීර්ණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

24. ආහාර ජීර්ණ පද්ධතියට අයත් ඉන්ද්‍රියන් 05 නම් කරන්න.

25. ආහාර ජීර්ණ ක්‍රියාවලියේදී ජීර්ණ යුෂ ශ්‍රාවය කරන ඉන්ද්‍රියන් 04ක් නම් කරන්න.